# ගම නැගුමට කෙතට අරුණ

## ප්‍රජා සැලසුම් සකස් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන

2006 පෙබරවාරි 13 - 16

**ක්ෂේත්‍ර අධ්‍යයන වාර්තාව**

**(හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉහළ ගුරුවල සහ වීරගස්වැව යන ගම්මාන සඳහා සකස් කෙරිණ.)**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණුකිරීමේ ආයතනය
114 විජේරාම මාවත
කොළඹ 07

711.3
(SL)
හෙක්ට
21242

2009/06 2010/04
250/=

පටුන | පිටුව


| | | |
|---|---|---|
| පටුන | | 1 |
| වගු සටහන් | | 111 |
| රූප සටහන් | | 111 |
| 01 | හැඳින්වීම | 1 |
| 1.1 | පිවිසුම | 1 |
| 1.2 | පුහුණු වැඩසටහන | 2 |
| 1.3 | අරමුණු | 2 |
| 1.4 | පුහුණු ලාභීන් | 3 |
| 1.5 | ක්ෂේත්‍ර අභ්‍යාස | 3 |
| 02 | ඉහළ ගුරුවල ගම්මානය | 4 |
| 2.1 | ගමේ පිහිටීම | 4 |
| 2.2 | ගමේ ඉතිහාසය | 4 |
| 2.3 | යටිතල පහසුකම් | 5 |
| 2.4 | ජනගහණය | 6 |
| 2.5 | අධ්‍යාපන මට්ටම | 6 |
| 2.6 | රැකියා ස්වභාවය හා ජීවන මාර්ග | 6 |
| 2.7 | නිවාසවල තත්ත්වය හා උපකරණවල අයිතිය | 7 |
| 2.8 | සනීපාරක්ෂක හා වෙනත් පහසුකම් | 7 |
| 2.9 | ඉඩම් අයිතිය හා භුක්තිය | 7 |
| 2.10 | කෘෂිකාර්මික කටයුතු | 8 |
| 2.11 | සත්ව පාලනය | 9 |
| 2.12 | ආහාර පරිභෝජනය | 10 |
| 2.13 | ගමේ සම්පත් හා සංවර්ධන ප්‍රවනතා | 13 |
| 2.14 | ඉහළ ගුරුවල ගම්මානයේ ගම්වාසීන් විසින් හඳුනාගත් ප්‍රධාන ගැටළු | 13 |
| 2.15 | හරස්කඩ චාරිකාව - ගුරුවල ග්‍රාමය | 18 |
| 2.16 | සංවර්ධන සැලසුම - ඉහළ ගුරුවල ගම්මානය | 21 |
| 2.17 | ඉහල ගුරුවල ගමේ සිතියම | 23 |


21242
HARTI

| | | |
|---|---|---|
| 03 | විරගස්වැව ගම්මානය | 24 |
| 3.1 | ගමේ පිහිටීම | 24 |
| 3.2 | ඉතිහාසය හා කාල රේඛාව | 24 |
| 3.3 | ජනගහණය හා අධ්‍යාපනය | 25 |
| 3.4 | රැකියා සහ ආදායම් තත්ත්වය | 25 |
| 3.5 | කෘෂිකාර්මික කටයුතු | 26 |
| 3.6 | මාර්ග පද්ධතිය හා භෞතික යටිතල පහසුකම් | 27 |
| 3.6.1 | මාර්ග පද්ධතිය | 27 |
| 3.6.2 | භෞතික යටිතල පහසුකම් | 27 |
| 3.6.2.1 | ජල සම්පාදන ක්‍රම(කෘෂිකාර්මික කටයුතු සඳහා) | 27 |
| 3.6.2.2 | ජල සම්පාදන කටයුතු (සාමාන්‍ය භාවිතය) | 27 |
| 3.6.2.3 | නිවාස හා වැසිකිලි පහසුකම් | 27 |
| 3.6.2.4 | කෘෂි උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා වාහන | 28 |
| 3.7 | ඉඩම් පරිහරණය හා භුක්තියේ ස්වරූපය | 28 |
| 3.8 | ප්‍රජා සංවිධාන | 29 |
| 3.9 | සේවා සපයන ආයතන මගින් ගමට ඇති බලපෑම | 29 |
| 3.10 | විරගස්වැව ගම්මානයේ ප්‍රමුඛතාගත ගැටලු | 37 |
| 3.11 | ව්‍යාපෘති සැලැස්ම | 40 |

වගු සටහන්


| | | පිටුව |
|---|---|---|
| 2.1 | ගමට සේවා සපයන ආයතනවල පිහිටීම | 05 |
| 2.2 | ගමේ ඉඩම් අයිතිය හා භුක්තිය | 08 |
| 2.3 | වසරකට සාමාන්‍යයෙන් ඒ ඒ භෝග වගා කරන බිම ප්‍රමාණය හා අස්වැන්න | 09 |
| 2.4 | සත්ව පාලනය | 09 |
| 3.1 | අධ්‍යාපන මට්ටම - වීරගස්වැව ගම්මානය | 25 |
| 3.2 | රැකියා නියුක්තිය - වීරගස්වැව ගම්මානය | 26 |


රූප සටහන්


| | | |
|---|---|---|
| 01 | ඉහළ ගුරුවල ගමේ ස්වේච්ඡා සංවිධාන ව්‍යුහය | 11 |
| 02 | ඉහළ ගුරුවල ගමට සේවා සපයන රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතන | 12 |
| 03 | ඉහළ ගුරුවල ප්‍රවනතා විශ්ලේෂණය - 1960 - 2000 | 13 |
| 04 | හඳුනාගත් ගැටළු - ද්විත්ව/යුගල සැසඳීම (ගුරුවල ගම්මානය) | 14 |
| 05 | වර්ෂාපතනය/උෂ්ණත්වය වෙනස්වීම් - ඉහළ ගුරුවල | 15 |
| 06 | බෝග වගා කාල සටහන - ඉහළ ගුරුවල | 16 |
| 07 | කෘෂිකාර්මික කටයුතුවල ශ්‍රම විභජනය | 17 |
| 08 | ඉහළ ගුරුවල - ගැටළු ගස | 19 |
| 09 | ඉහළ ගුරුවල - ඉලක්ක ගස | 20 |
| 10. | ගම තුල පිහිටි ප්‍රජා සංවිධාන ඒවායෙහි සාමාජික සංඛ්‍යාව අනුව හා ගමෙන් පිටස්තරව සාමාජිකත්වය බෙදී ඇති ආකාරය | 30 |
| 11. | වීරගස්වැව ගම්මානයේ පිහිටි ප්‍රජා සංවිධාන මගින් ගමට ඇති බලපෑම දැක්වෙන වෙන් රූප සටහන | 31 |
| 12. | සේවා සපයන ආයතන මගින් ගමට ඇති බලපෑම දැක්වෙන වෙන්රූප සටහන | 32 |
| 13. | වීරගස්වැව ගම්මාන සිතියම | 33 |
| 14. | හරස්කඩ චාරිකාව (වීරගස්වැව ගම්මානය) | 34 |
| 15. | බෝග වගා කාල සටහන (වීරගස්වැව) | 35 |
| 16. | උෂ්ණත්වය හා වර්ෂාපතනය - වීරගස්වැව ගම්මානය | 36 |
| 17. | කාර්ය බහුලතාවය - වීරගස්වැව ගම්මානය | 36 |
| 18. | ගැටළු ගස - වීරගස්වැව ගම්මානය | 38 |
| 19. | අරමුණු ගස - වීරගස්වැව ගම්මානය | 39 |


ඇමුණුම්


| | | |
|---|---|---|
| 01 | පුහුණු වැඩසටහනෙහි සම්පත් දායකයින් | 41 |
| 02 | පුහුණු ලාභීන්ගෙ නම් හා ලිපිනයන් | 43 |
| 03. | ක්ෂේත්‍ර අධ්‍යයනය පැවැත්වූ ගම්මාන අනුව සහභාගී වූවන්ගේ නාම ලේඛනය | 45 |

# පළමු පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පිවිසුම

ශ්‍රී ලංකාවේ ගම්මාන පහළොස් දහසක් සැලසුම් සහගත ලෙස සංවර්ධනය කිරීම වර්තමාන රජය විසින් අරඹා ඇති එක් දැවැන්ත සංවර්ධන වැඩසටහනකි. මේ යටතේ පිහිටුවීමට යෝජිත "ග්‍රාම සභා" තුලින් මෙම "ගම නැගුම" සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. මෙම "ගම නැගුම" සංකල්පයේ මූලික අරමුණ වන්නේ ග්‍රාමීය ජනතාවගේ සංවර්ධනය සඳහා ඔවුන්ගේ ද අත්දැකීම් මුසු කරමින් සැබෑ සැලසුම්කරණයක් කොට එම සැලසුම් ක්‍රියාත්මක කිරීමෙහිලා ඔවුන් ද කොටස් කරුවන් කර ගැනීමයි.

සංවර්ධනය තිරසර එකක් වීමට නම් එය ජන සහභාගිත්වයෙන් සිදු කළ යුතු බව අද පුළුල් වශයෙන් පිළිගත් සත්‍යයකි. සැලසුම්කරන අවධියේ සිට ප්‍රතිලාභ භුක්ති විඳීම දක්වා වූ සෑම අවධියකදී ම ජනසහභාගිත්වය මෙහිදී බලාපොරොත්තු වේ. අද බොහෝ රටවල ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන්වලදී සංවර්ධනයේ තිරසාර භාවය සඳහා අනිවාර්ය අංගයක් ලෙස ජන සහභාගිත්වය ලබා ගැනීම සිදුවන්නකි.

ඕනෑම සංවර්ධන වැඩසටහනක දී ම ප්‍රථම කාර්යය වන්නේ කළ යුත්තේ ඒ සඳහා ක්‍රියාකාර සැලැස්මක් සකස් කිරීමයි. ග්‍රාමීය/ප්‍රජා සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී ගම්වලින් තොරතුරු රැස් කිරීම සඳහාත් සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සලසන ආයතන හා ප්‍රජාවන් අතර ක්‍රමවත් හා නිසි සංනිවේදන ක්‍රියාවලියක් ගොඩනැගීම සඳහාත් විවිධ ක්‍රම අනුගමනය කරයි. මෙයින් වඩාත් උචිත ක්‍රමෝපායයක් ලෙස "සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය" (PRA) වඩාත් ජනප්‍රිය වූවකි. එබැවින් මේ පිළිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුමක් ග්‍රාමීය සංවර්ධන කටයුතුවල නියැලෙන ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලබා දීම ඉතා වැදගත් කරුණකි.

කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 70% ක්ම ග්‍රාමීයව ජීවත් වන අතර ඉන් බහුතරයක් කෘෂිකර්මය හා අදාල ක්ෂේත්‍රයන්ගෙන් ජීවනෝපාය සලසා ගනී. එබැවින් "ගම නැගුම" වැඩසටහන තුලින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සංවර්ධනයට මූලික තැනක් දී කටයුතු කළයුතු බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. ග්‍රාමීය ගොවිජනයා මුහුණ දී ඇති ප්‍රධාන ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම සඳහා ක්‍රමවත් සැලසුම් සකස් කිරීම මෙහිලා වැදගත් වේ. ග්‍රාමීය ගොවි ජනතාවගේ සැබෑ ප්‍රශ්නයන් හඳුනාගෙන ඔවුන්ගේ අවශ්‍යතාවයන් මත සැලසුම් සකස් කිරීම සිදුවිය යුතුය. මේ සඳහා ඔවුන්ට අවශ්‍ය වන නව දැනුම ඔවුන් වෙත ලබාදිය යුතුව ඇත. ඔවුනට එම දැනුම ලබා දීම ඉලක්ක කරගත් ප්‍රජා ක්‍රියාකාර සැලසුම් සකස් කිරීම පිළිබඳ

පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය මගින් අරඹා ඇත. මෙය එම වැඩසටහන් මාලාවේ ප්‍රථම වැඩසටහනයි.

## 1.2 පුහුණු වැඩසටහන

සහභාගිත්ව ගැමි පිරිසුම් ක්‍රමය (PRA) පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැලී සිටින නිලධාරීන් වෙත ලබා දීම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් පුහුණු වැඩසටහන් රාශියක් සැලසුම් කර ඇති අතර, ඉන් පළමුවැන්න 2006 පෙබරවාරි මස 13 දින සිට 16 දින දක්වා අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ දී පවත්වනු ලැබීය. කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන මෙම පුහුණු වැඩසටහන් සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මූල්‍ය අනුග්‍රහය දක්වයි. මේ යටතේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විශේෂ වැඩසටහන නියෝජනය කරමින් ආචාර්ය මර්වින් ජෝශප් හා ඒ.එම්.ජයසේකර යන මහත්වරුන් සම්පත් දායකයින් ලෙස මෙම ප්‍රථම වැඩසටහනට සහභාගි විය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සම්පත් දායකයින් හා අනෙකුත් යටිතල පහසුකම් සැපයීමට අමතරව පුහුණු පාඨමාලාව ක්‍රියාත්මක කිරීමටත්, එය සාර්ථක කරගැනීමටත් කටයුතු කලේය. (සම්පත් දායකයින්ගේ නාම ලේඛනය සඳහා ඇමුණුම 1 බලන්න)

## 1.3 අරමුණ

"ගම නැගුමට කෙතට අරුණ" යන තේමාව යටතේ ජන සහභාගිත්වය තුලින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා ක්‍රියාකාර සැලසුම් සකස් කිරීම පිළිබඳ මූලික සංකල්ප හා විධි ක්‍රම පිළිබඳව පුහුණුවන්නන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම මෙම පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.

වැඩසටහනෙහි විශේෂිත අරමුණ වූයේ වැඩසටහන අවසානයේ දී පුහුණු වන්නන් හට

- ජන සහභාගිත්ව සංකල්පය විස්තර කිරීමට හා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී එහි ඇති වැදගත්කම හඳුනාගැනීමට.
- ගෘහස්ත ආදායම වැඩි කරගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රමෝපායන් හඳුනා ගැනීමට
- ජාතික කෘෂිකර්ම සංවර්ධන වැඩසටහනේ ග්‍රාමීය දායකත්වය කුමක්දැයි විස්තර කිරීමට
- ගමේ ඇති සම්පත් හඳුනා ගන්නා අයුරු විස්තර කිරීමට
- දත්ත එකතු කිරීමේ විවිධ ක්‍රම මොනවාද යන්න ලැයිස්තු ගත කිරීමට
- ව්‍යාපෘති චක්‍ර කළමනාකරණ සංකල්පය කුමක්දැයි විස්තර කිරීමට
- නායකත්ව ස්වභාවයන් 04 ක් නම් කිරීමට

- ග්‍රාම සංවර්ධනයට බලපෑ හැකි ගැටලු හඳුනාගැනීම, ඒවා පෙළගැස්වීම හා ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීමට හා
- ප්‍රජා ක්‍රියාකාර සංවරධන සැලැස්මක් නිවැරදිව සකස් කිරීමට

හැකියාව ලබා දීමයි.

### 1.4 පුහුණු ලාභීන්

වැඩසටහන සඳහා හම්බන්තොට හා මොණරාගල යන දිස්ත්‍රික් නියෝජනය කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙක් ද, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරු හතරදෙනෙක් ද, විෂයභාර නිලධාරීන් හත් දෙනෙක් ද කෘෂිකර්ම උපදේශක නිලධාරී මහතුන් දහහතර දෙනෙක් ද සහභාගි වූහ. (පුහුණු ලාභීන්ගේ නාම ලේඛනය ඇමුණුම අංක 02 හි දැක්වේ)

### 1.5 ක්ෂේත්‍ර අභ්‍යාස

වැඩසටහන තුලින් පුහුණු ලාභීන් න්‍යායාත්මකව දැනුවත් වූ සහභාගිත්ව සංවර්ධන විධි ක්‍රම ප්‍රායෝගිකව අත්හදා බැලීමට අවස්ථාවක් සැලසීම සඳහා ක්ෂේත්‍ර අභ්‍යාසයක් සිදු කරනු ලැබීය. එය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගුරුවල හා වීරගස්වැව යන ග්‍රාම නිලධාරී වසම් තුල පිහිටි ඉහල ගුරුවල හා වීරගස්වැව යන ගම්මානවල 2006 පෙබරවාරි 15 වන දින සිදු කෙරින. ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා සහභාගි වූවන්ගේ නාම ලේඛනය ඇමුණුම් අංක 3 හි දැක්වේ. වැඩසටහන අවසානයේ දී මෙම ගම්මාන දෙක පදනම් කරගෙන සකස් කරන ලද ප්‍රජා සංවර්ධන සැලැස්ම ද, රැස්කළ තොරතුරු හා අනෙකුත් සොයාගැනීම් ඇතුලත් වාර්තා ද මෙහි අඩංගු වේ.

## දෙවන පරිච්ඡේදය

### ඉහළ ගුරුවල ගම්මානය

### 2.1 ගමේ පිහිටීම

ඉහළ ගුරුවල ගම්මානය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගුරුවල ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති කුඩා ගම්මානයකි. අඟුණකොළපැලැස්ස මිද්දෙණිය මාර්ගයේ බූවැලිආර හන්දියෙන් වමට හැරි කි.මී. 1 ක් පමණ දුරින් මෙම ගම පිහිටා ඇත.ඉහළ ගුරුවල ගම තෙලඹුයාය වශයෙන් ද ගම්මුන් හඳුන්වයි. තෙලඹුයාය යන විශාල ග්‍රාමය ග්‍රාම නිලධාරි වසම් තුනකට අයත් වන සේ කැඩී ඇති අතර ඉන් එක් කොටසක් ඉහළ ගුරුවල ගම වශයෙන් හඳුන්වයි.

### 2.2 ගමේ ඉතිහාසය

රජයට අයත් ඉඩම්වලින් සමන්විත ඉහළ ගුරුවල ප්‍රදේශය පිට ප්‍රදේශවලින් පැමිණ ඉඩම් අත්පත් කරගෙන පදිංචි වී හේන් ගොවිතැනින් ජීවත් වූ ගොවීන්ගෙන් සමන්විත ය. මෙසේ බාහිරින් පැමිණි අයගෙන් ආරම්භ වූ ගම ක්‍රමයෙන් විකාශනය වී අද පවුල් 102 ක් දක්වා වර්ධනය වී ඇත. තමා පදිංචි ඉඩම්වල නීත්‍යානුකූල අයිතියක් තවමත් ගොවීන්ට නොමැත. පොදු පහසුකම්වලින් ඌණ වූ මෙම ගම්වාසීන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ හේන් ගොවිතැනයි. මෙම ගමේ කුඹුරු ඉඩම් නොවීම හේතුවෙන් ඔවුන් හේන් වගාවෙන් දිවි රැක ගැනීමට කටයුතු කර ඇත.

කාල රේඛාව

- ගමේ ආරම්භක වකවානුව නොදනී
- 1950 තෙලඹුයාය විදුහල ආරම්භ වීම (ගුරුවල වසම තුළ)
- 1956 උඩයාල ගම්මුලාදැනි වසම ආරම්භ වීම
- 1969 උඩයාල ගොවි සංවිධානය පිහිටුවීම
- 1969 මුරුතවෙල ව්‍යාපාරය ආරම්භ වීම
- 1972 මුරුතවෙල ව්‍යාපාරයේ ජලය ලැබීම - මේ තුලින් මේ ගමට ද අනියම් රැකියා අවස්ථා උදාවීම
- 1989 මරණාධාර සමිතිය ආරම්භ වීම
- 1995 FORUTසංවිධානය පැමිණීම

## 2.3 යටිතල පහසුකම්

මෙම ගමට ප්‍රධාන මාර්ගයේ සිට ඇතුල්වීමට ඇත්තේ බොරළු දමා සකස් කරන මාර්ගයකිනි. ගමේ තාර දමා සකස් කරන ලද මාර්ග නොමැත. පාසල්, විහාරස්ථාන හා වෙනත් පොදු සේවා ස්ථාන කිසිවක් නොමැත. මුරුතවෙල ව්‍යාපාරය යටතේ ඉදි කරන ලද ප්‍රධාන ජල මාර්ගයක් ද උඩවලව ව්‍යාපාරය යටතේ ඉදි කරන ලද ප්‍රධාන ජල මාර්ගයකින් ද මැදිව මෙම ගම පිහිටා තිබුනත් මෙම ගම එම ජල මාර්ග වලින් පෝෂණය නොවේ. ළඟදී ඉදි කරන ලද කුඩා වැවක් ගමෙහි ඇතත් එහි තවමත් ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් රැදී නොමැත. ගමට විදුලි පහසුකම් ඇත. නිවෙස්වලට ජල පහසුකම් නොමැත. පානීය ජලයේ අවශ්‍යතාවය සපුරාලීමේ අරියෙන් ප්‍රජා ජල සම්පාදන ක්‍රමයක් දැනට ඉදිවෙමින් පවතී. රජයේ සේවා සපයන ආයතන හෝ කිසිම කර්මාන්ත ඒකකයක් මෙම ගම තුල පිහිටා නොමැත. ගම්වැසියන්ට රැස්වීම් සඳහා භාවිතා කිරීමට පොදු ස්ථානයක් ලෙස දැනට ඇත්තේ FORUT ආයතනයේ රැස්වීම් ශාලාව පමණි. ගමට සේවා සපයන හා වැදගත් වන ආයතනවල පිහිටීම පිළිබඳව සංඛ්‍යා සටහන් 2.1 වගුවෙන් පැහැදිලි කෙරේ.

2.1 වගුව : ගමට සේවා සපයන ආයතනවල පිහිටීම

| ආයතනය | පිහිටීම | ගමේ සිට දුර (කි.මී.) |
|---|---|---|
| සමුපකාර ප්‍රාදේශිකය | ගමෙන් පිට | 01 |
| රෝහල | ගමෙන් පිට | 05 |
| බැංකු | ගමෙන් පිට | 05 |
| ඉන්ධනහල් | ගමෙන් පිට | 08 |
| ගොවිජන සේවා මධ්‍යස්ථාන | ගමෙන් පිට | 10 |
| පාසල (උ.පෙ.) සහිත | ගමෙන් පිට | 05 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

ගමෙහි ක්‍රියාත්මකව පවතින ප්‍රධාන සංවිධානය වන්නේ මරණාධාර සමිතියයි. ගොවි සංවිධාන, කාන්තා, යෞවන, ග්‍රාම සංවර්ධන වැනි ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රයේ සමිති කිසිවක් මෙම ගමෙහි පිහිටා නැත. 1995 සිට මෙම ගමෙහි ක්‍රියාත්මක වන FORUT ආයතනය ගමේ ප්‍රජා සංවර්ධන කටයුතුවල සුළු වශයෙන් නියැලී සිටී. මීට අමතරව ළඟදී ගොඩනගන ලද වැව ඉදිකිරීමේ කටයුත්ත සඳහා පිහිටුවන ලද කුඩා වැව සංවර්ධන සමිතිය නම් සංවිධානයක් ද ගමෙහි ක්‍රියාත්මකව පවතී.

## 2.4 ජනගහණය

ගම්මානය පවුල් 102 කින් සමන්විත වන අතර මුළු ජනගහණය 725 කි. එය ස්ත්‍රී, පුරුෂ වශයෙන් පිළිවෙලින් 395 හා 330 කින් සමන්විත වේ. ගමේ සියළු දෙනාම සිංහල - බෞද්ධ ජන කොටසට අයත් වෙති. ඔවුන් එකම පරම්පරාවකින් පැවතෙන්නන් නොවුනත් ඔවුන් සාමකාමීව මෙන්ම බලවත් දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවති. ස්ථිර ආදායම් මාර්ග ගම තුල නොමැති බැවින් බොහෝ දෙනෙකු මුරුතවෙල ව්‍යාපාරයේ හා උඩවලව ව්‍යාපාරයේ තාවකාලික කෘෂිකාර්මික රැකියාවලට සංක්‍රමණය වීමට පුරුදු වී සිටිති.

## 2.5 අධ්‍යාපන මට්ටම

ඉහළ ගුරුවල ගමේ ළමුන් ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නේ ගමට කි.මී. 2 ක් පමණ දුරින් පිහිටි තෙලඹුයාය කණිෂ්ඨ විද්‍යාලයෙනි. මෙම ගමේ පාසැල් යන ළමුන 400 ක් වන අතර එය පිරිමි ළමුන් 170 කින් හා ගැහැණු ළමුන් 230 කින් සමන්විතය. පාසල් යන වයසේ පසුවුනත් එහෙත් එසේ නොයන ළමයි සංඛ්‍යාව 12 කි. උසස් පෙළ සමතුන් 6 දෙනෙක් පමණක් සිටින මෙම ගමේ සාමාන්‍ය පෙළ සමත් වූ සංඛ්‍යාව 30 කි. එයින් ද වැඩි පිරිසක් (20) ක් ගැහැණු ළමුන් වේ. ගමේ බහුතරයකගේ අධ්‍යාපනය 8 වන ශ්‍රේණිය දක්වා පමණි. උසස් අධ්‍යාපනය ලත් ළමුන් කිසිවකු නොමැත.

## 2.6 රැකියා ස්වභාවය හා ජීවන මාර්ග

ගමේ බහුතරයකගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ ගොවිතැනයි. කුඹුරු ඉඩම් හිමි නැති මොවුන් හේන් ගොවිතැනෙහි යෙදී සිටිති. රජයේ හා පෞද්ගලික අංශවල රැකියාවල නියැලී සිටිනුයේ 25 දෙනෙකු පමණි. මින් 11 දෙනෙකු කාන්තාවන් වන අතර පිරිමි 14 දෙනෙකි. ජීවනෝපාය මාර්ගයක් වශයෙන් කෘෂිකර්මාන්තයේ යෙදී ඉන්නා අතරම ශ්‍රමිකයන් වශයෙන් ද ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාරවල ශ්‍රමය යෙදීමෙන් ජීවිකාව ගෙන යති. ගමෙහි ස්වයං රැකියාවක නියැලී ඇත්තේ එක් කාන්තාවක් පමණි. එය කුඩා පරිමාණ සිල්ලර වෙළඳසැලකි. ගමෙහි කෘෂිකාර්මික කම්කරු රැකියාවන්හි නියුක්ත පිරිස කාන්තාවන් 30 ක් හා පුරුෂයන් 150 දෙනෙකු වේ. මොවුන් සියළුදෙනාම තමන්ගේ ගොවිතැන්වලට අමතරව කෘෂි කම්කරු රැකියාවේ යෙදී සිටින්නන් වෙති. ස්වයං රැකියා ලෙස ගඩොල් නිෂ්පාදනය කිරීම සිදු කරන්නේ වසරේ සීමිත කාලයක් පමණි. ජලය සපයා ගැනීමේ අපහසුව එම කර්මාන්තයේ නිරන්තරයෙන් යෙදී සිටීමට ඇති ප්‍රධාන බාධකයයි. ස්ථිර රැකියා මාර්ග නොමැති වීමෙන් ගමේ බහුතරයක් පහළ ආර්ථික තත්ත්වයකින් පසු වේ. ගමේ පවුල් සංඛ්‍යාවෙන් 80 ක් ම (78%) සමෘද්ධිලාභී පවුල් ය. ඉහළ ආර්ථිකයක් සහිත පවුල් ගම තුල නොමැත. ගමේ පවුල් 15 (14%) ගේ ආර්ථික තත්ත්වය ඉතාමත් පහළ මට්ටමක පවතී.

## 2.7 නිවාසවල තත්ත්වය සහ උපකරණවල අයිතිය

මෙම ගමේ නිවාස 102 කි. උළු සෙවිලිකල ස්ථිර නිවාස 82 ක් වන අතර නිවාස 20 ක් පොල් අතු සෙවිලි කල තාවකාලික නිවාස වේ. ගමට විදුලි බලය සපයා ඇතත් විදුලි බලය ලබාගෙන ඇත්තේ නිවාස 35 කට පමණි. නිවෙස්වල නල ජල පහසුකම් නොමැත. ප්‍රවාහන සඳහා ඇත්තේ යතුරුපැදි 07 ක් පමණි. පොදු ප්‍රවාහන සේවය ක්‍රියාත්මක වන ප්‍රධාන මාර්ගයට දුරින් පිහිටා ඇති මේ ගමේ ජනතාවගේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය වනුයේ පාපැදියයි. සෑම නිවසකම පාහේ පාපැදියක් දක්නට ඇත. කෘෂිකාර්මික උපකරණ ලෙස රෝද 4 ට්‍රැක්ටර් 4 ක් ගමෙහි ඇත. නමුත් ගොවි පවුල් 102 ක් ජීවත් වුවත් වීරගස්වැව ගමෙහි ඇත්තේ තෙල් ඉසින යන්ත්‍ර 12 ක් පමණි.

## 2.8 සනීපාරක්ෂක හා වෙනත් පහසුකම්

මෙහි පානීය ජලය ලබාගන්නා ප්‍රධාන මාර්ගය වනුයේ ගම තුල පිහිටා ඇති පෞද්ගලික ළිං හා එකම නල ළිඳයි. නෑම, රෙදිපිළි සේදීම වැනි වැඩියෙන් ජලය භාවිත වන අවශ්‍යතාවයන් සඳහා ප්‍රධාන ඇල මාර්ගවලට යාමට පුරුදු වී ඇත. දැනට ඉදිවෙමින් පවතින ප්‍රජා ජල සම්පාදන ක්‍රමයේ වැඩ නිමවූ පසු ගෘහස්ත ජල ප්‍රශ්නය බොහෝ දුරට විසඳෙනු ඇත. ස්ථිර ජල මුද්‍රිත වැසිකිළි ඇත්තේ නිවාස 40 කට (37%) පමණි. ඉතිරි නිවාස 62 ම (63%) තාවකාලිකව ගොඩ නගාගත් වැසිකිළි භාවිතා කරයි. ගමේ ඇති පෞද්ගලික ළිං පවුල් කිහිපයක්ම භාවිතා කිරීම නිසා ජලය සෞඛ්‍යාරක්ෂිත නොවීමේ ගැටලුව මතු වී ඇත.

## 2.9 ඉඩම් අයිතිය හා භුක්තිය

ඉහළ ගුරුවල ගමේ ප්‍රධාන භෞතික සම්පත ඉඩම් ලෙස පෙන්වා දිය හැක. අක්කර 350 ක ගොඩ ඉඩම් ප්‍රමාණයක් මෙම ගමට අයත් වන අතර කුඹුරු ඉඩම් කිසිවක් නොමැති බව නිල ලේඛන පෙන්වයි. එසේ වුවත් තෙතමනය රැඳී පවතින බිම් කොටස් ස්වල්පයක වී වගා කරනු ලබයි. මෙය අතහැර දමන ලද වැවකට අයත් බිම් කොටසකි. ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් (අක්කර 308 ක් ම) රජයට අයත් ඉඩම් වුවත් ගම්වැසියන් ඒවා භුක්ති විඳින්නේ බොහෝ කල් සිට ය. ගොවීන් මෙම ඉඩම්වල බලපත්‍ර යටතේ පදිංචි වී සිටී. එම ඉඩම් සඳහා නීත්‍යානුකූල ඔප්පු තවම ලබා දී නොමැත. අක්කර 12 ක රක්ෂිතයක් ද ගම සතු වේ. ගමේ විශාල ඉඩම් ප්‍රමාණයක් පැවතුනත් ක්‍රමානුකූල වගාවන් සඳහා යොදාගෙන ඇත්තේ සුළු ප්‍රමාණයක් පමණි. ජල හිඟය හා නොදැනීම එයට ප්‍රධාන හේතුවයි. ක්‍රමවත් ජල පහසුකම් පවතී නම් විශාල ඉඩම් ප්‍රමාණයක් වගා කිරීමේ හැකියාව පවතී. ගමේ ගොවීන් සතු ඉඩම්වල ප්‍රමාණයන් සහ භුක්තියේ ස්වභාවය 2.2 දරණ වගුවෙන් පැහැදිලි කෙරේ.

2.2 වගුව : ගමෙහි ඉඩම් අයිතිය හා භුක්තිය

| ප්‍රමාණය (අක්කර) | ඉඩම් භුක්තිය | |
|---|---|---|
| | ස්වභාවය | පවුල් ගණන |
| 0 > 1/4 | බලපත්‍රලාභී | 02 |
| 1/4 > 1/2 | බලපත්‍රලාභී | 03 |
| 1/2 > 1 | බලපත්‍රලාභී | 40 |
| 1 > 2 | බලපත්‍රලාභී | 40 |
| 2 > 5 | බලපත්‍රලාභී | 12 |
| > 5 | බලපත්‍රලාභී | 05 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

## 2.10 කෘෂිකාර්මික කටයුතු

නිත්‍යානුකූල කුඹුරු ඉඩම් මෙම ගමෙහි නොමැති වුවත් ගම් වැසියන් කිහිපදෙනෙකු මෙම ගමේ ජලය රැඳෙන පහත් තැන්වල වී වගාව කරති. අහස් දියෙන් කරන මෙම වගාව සිදු වන්නේ මහ කන්නයේ පමණි. මුරුතවෙල හා මහවැලි ව්‍යාපාරවල කුඹුරු ඉඩම් අඳයට/බද්දට වගා කිරමේ ද නියැලී සිටිති. ගොඩ ඉඩම් අක්කර 350 ක ප්‍රමාණයක් තිබුණත් ක්‍රමානුකූලව වගාවන් ලෙස පවත්වා ගෙන යන්නේ අක්කර 43 ක පමණ (12.0%) ඉඩම් ප්‍රමාණයකි. එම ඉඩම්වල පොල්, කෙසෙල්, දෙහි, ගස්ලබු, මඤ්ඤොක්කා වැනි බෝග වගා කර ඇත. වාර්ෂික බෝග වගා කර නැති ඉඩම්වල තේක්ක වැනි වන වගාවන් ස්වල්ප වශයෙන් සිදු කෙරේ. එය ද ක්‍රමානුකූල වගාවන් නොවේ. බොහෝ ගොඩ ඉඩම් මුඩු බිම් ලෙස පවතී.

මහ කන්නයේ වැසි ලැබීමත් සමග තම ගොඩ ඉඩම්වල කුරක්කන්, බඩ ඉරිඟු, එළවළු වැනි බෝග වර්ග වගා කරති. යල කන්නයේ ප්‍රධාන වශයෙන් තල වගා කරති. මේ ප්‍රදේශයේ විශාල වශයෙන් වගා වන්නේ කුරක්කන් ය. සාමාන්‍යයෙන් මහ කන්නය තුළ අක්කර 40 ක පමණ කුරක්කන් වගා කරති. වගාවට අවශ්‍ය මුදල් සපයා ගැනීම අපහසු නිසාත් ජලය නොමැති නිසා ඇතිවන අස්ථිර භාවය නිසාත් ගොවීන් කුරක්කන් වැනි අඩු වියදමකින් වගා කළ හැකි බෝග වගා කිරීමට උනන්දුවක් දක්වති. හේන් වගාව යටතේ සිදු කරන බෝගයන් 2.3 දරණ වගුවෙන් දක්වයි.

2.3. වගුව - වසරකට සාමාන්‍යයෙන් ඒ ඒ බෝග වගා කරන බිම් ප්‍රමාණය හා අස්වැන්න

| බෝගය | වගා කරන බිම් ප්‍රමාණය අක්කර | සාමාන්‍ය අස්වැන්න කි.ග්‍රෑම්/අක්කර |
|---|---|---|
| කුරක්කන් | 30 | 12000 |
| මුං | 03 | 1100 |
| තල | 04 | 1400 |
| රටකජු | 02 | 800 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

ගමෙහි කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ඇති ආසන්නම වෙළඳපොළ අඟුණකොළපැලැස්ස නගරයයි. විශාල වශයෙන් වගාවන් සිදු නොවීම හේතුවෙන් ගොවි ද්‍රව්‍ය මිලදී ගන්නා සංචාරක වෙළෙඳුන් ගමට පැමිණෙන්නේ අල්ප වශයෙනි. එබැවින් ලැබෙන සුළු අස්වැන්න පවා අලෙවි කිරීමට නගරයට ගෙන යාමට ගැමියන්ට සිදු වේ. එපමණක් නොව අස්වනු නෙලන සමයේ දී මිල අඩුවීම නිසා ඔවුන්ට ලැබෙන්නේ ද අඩු මිලකි. කෘෂිකාර්මික ඉඩම් සංවර්ධනය කර හොඳින් පවත්වාගෙන යාමට ගොවීන් උනන්දුවක් නොදක්වයි. ඒ පිළිබඳව නිසි අවබෝධයක් නොමැති වීම එයට ප්‍රධාන හේතුව ලෙස හැඳින්විය හැකිය. කෘෂිකර්ම ව්‍යාප්ත සේවයේ සේවාවන් ඔවුන්ට නොලැබී යන බව පෙනී යයි. ඉඩම්වලට නිත්‍යානුකූල ඔප්පු නොමැති වීම ද ඉඩම් සංවර්ධනය කිරීමට උනන්දු නොවීමට එක් හේතුවකි. මෙම ගමෙහි ගොවීන් කෘෂිකර්මාන්තයේ දී මුහුණපාන තවත් ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ අයාලේ යන ගවයන්ගෙන් වගාවට හානි සිදුවීමයි.

## 2.11. සත්ව පාලනය

සත්ව පාලනය ජීවන වෘත්තියක් වශයෙන් කරන්නේ පවුල් 02 ක් පමණි. ඔවුන් යෙදී සිටින්නේ ගව පාලනයේ ය. එළුවන්, කුකුළන් හා ඌරන් වැනි සතුන් ඇති කිරීමෙහි කිසිවකු නියැලෙන්නේ නැත.

2.4 වගුව - සත්ව පාලනය

| සත්ව වර්ගය | යෙදී සිටින පවුල් | සතුන් සංඛ්‍යාව |
|---|---|---|
| එළගවයන් | 01 | 05 |
| මී ගවයන් | 02 | 20 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI


නියං සමයන්හි දී ජලය සැපයීමේ අපහසුතාවය සතුන් ඇති කිරීමට උනන්දු නොවීමට බලපා ඇති ප්‍රධාන හේතුව ලෙස ගම්වාසීන් සමග කළ සාකච්ඡාවලදී අනාවරණය විය. ක්‍රමානුකූලව සත්ව පාලනය කිරීම පිළිබඳව අවබෝධයක් නොතිබීමත් එයට තවත් හේතුවක් ලෙස ඔවුන් පෙන්වා දුනි.

## 2.12 ආහාර පරිභෝජනය

ගමේ ජනතාවගෙන් බහුතරයක් ප්‍රධාන ආහාරවේල් සඳහා බත් අනුභව කරති. මීට අමතරව කුරක්කන්, බඩ ඉරිඟු ආශ්‍රිත අහාර ද භාවිතයට ගනිති. තිරිඟු පිටි හා තිරිඟු පිටි ආශ්‍රිත ආහාර අනුභවය අවම මට්ටමක පවතී. තේ පානය සඳහා එළකිරි ලබා ගැනීමට පහසුකම් ගම තුළ නොමැත. එමෙන්ම මත්ස්‍ය වගාවන් ද මෙහි නොමැත. ආහාර සඳහා මත්ස්‍යයන් වෙළඳපොළෙන් මිලට ගැනීමට සිදුවී ඇත.

වී නිෂ්පාදනයේ යෙදී සිටින්නේ ගම්වැසියන් සුළු පිරිසක් වීම හේතුවෙන් බහුතරයක් තමනට අවශ්‍ය සහල් වෙළඳපොළෙන් මිලට ගනී. මහ කන්නයේ නිෂ්පාදනය කරන භෝග වලින් කොටසක් තම නිවෙස්වල පරිභෝජනය සඳහා තබා ගැනීමට පුරුදු වී සිටී. ගමේ පරිභෝජන අවශ්‍යතාවයන්ගෙන් වැඩි කොටසක් වෙළඳපොළෙන් මිලට ගැනීමට මෙම ගම්මුන්ට සිදුවී ඇත.

රූප සටහන් අංක 1 - ඉහළ ගුරුවල ගමේ ස්වේච්ඡා සංවිධාන ව්‍යුහය





සටහන

- ඒ ඒ සංවිධාන පිළිබිඹු කරන වෘත්තයන්හි විශාලත්වය මගින් එ ඒ සංවිධානවල සාමාජිකත්වයේ ප්‍රමාණය පිළිබිඹු කෙරේ.

- වෘත්තයන් එකිනෙක වැටීම මගින් සමිති කිහිපයක් නියෝජනය කරන සාමාජිකත්වයේ ප්‍රමාණය පිළිබිඹු කෙරේ.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 2 ඉහළ ගුරුවල ගමට සේවා සපයන රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතන




සටහන

ආයතනවලින් ගමට සැපයෙන සේවාවන්ගේ වැදගත්කම අනුව ආයතන අංකනය කර ඇත.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

## 2.13 ගමේ සම්පත් හා සංවර්ධන ප්‍රවනතා

ගමේ සම්පත් හා සංවර්ධන ප්‍රවනතා පිළිබඳව අදහස් විමසීමේ දී ප්‍රවනතා විශ්ලේෂණය, හරස්කඩ චාර්කා සිතියම උපයෝගී කරගන්නා ලදී.

රූප සටහන් අංක 3 . ඉහළ ගුරුවල - ප්‍රවනතා විශ්ලේෂණය - 1960 - 2000

| | 1960 | 1970 | 1980 | 1990 | 2000 |
|---|---|---|---|---|---|
| ජනගහණය | xxx | xxxx | xxxxxx | xxxxxxxx | xxxxxxxx xx |
| කැළැව | xxxxxxxx x | xxxxxxx | xxxxxx | xxxxx | xxxx |
| වනසතුන් (අලි) ජනගහණය | xxxxx | xxxx | xxx | xx | x |
| වනසතුන් (මොනරු) | - | x | x | xx | xxx |
| වර්ෂාපතනය | xxxx | xxxx | xxx | xxx | xx |
| නිවෙස්වල තත්ත්වය | xxx | xxx | xxxx | xxxx | xxxxx |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාර් HARTI

මෙම ප්‍රවනතා විශ්ලේෂණය මගින් ගමේ ජනගහණය, කැළැව, වනසතුන්, වර්ෂාපතනය, නිවෙස්වල තත්ත්වය වැනි තොරතුරු කාලයත් සමග වෙනස් වී ඇති අන්දම පැහැදිලි කෙරේ.

## 2.14 ඉහල ගුරුවල ගම්මානයේ ගම්වාසීන් විසින් හඳුනාගත් ප්‍රධාන ගැටළු

සහභාගිත්ව ගැමි පිවිසුමේදී ගමේ ජනතාව මුහුණ දෙන ගැටළු රාශියක් හෙළිදරව් කර ගැනීමට හැකි විය. සමස්තයක් වශයෙන් ගත් කල මේ හැම ගැටළුවක්ම ඔවුන්ගේ අඩු සමාජ ආර්ථික තත්ත්වය කෙරෙහි සෘජුව බලපාන ගැටළු බව පෙන්වා දිය හැක. එම ගැටළු ප්‍රමුඛතා අනුව පෙළ ගැස්වීමේදී පහත සඳහන් ලෙස පෙන්වා දිය හැක.

1. ඉඩම්වලට නීත්‍යානුකූල ඔප්පු නොමැති වීම
2. වගාවන් සඳහා ජල පහසුකම් නොමැති වීම
3. කෘෂි ව්‍යාප්ත සේවාවන් නොලැබීම
4. ගොඩ බෝග වගාවන්ගේ අඩු ඵලදායීතාවය
5. තැපැල් සේවාවන් නොමැතිකම
6. සතුන්ගෙන් වන වගා හානි (හරකුන් හා මොනරුන්)
7. ගොවීන් අතර කිසියම්ම හෝ සංවිධානාත්මක ව්‍යුහයක් නොමැතිකම



21242


HARTI

රූප සටහන් අංක 4 : හඳුනාගත් ගැටළු - ද්විත්ව/යුගල සැසඳුම (ගුරුවල ගම්මානය)

| ගැටලුව | ඉඩම් අයිතිය නොමැති බව | කෘෂි ව්‍යාප්ති සේවාවන් නොලැබීම | ජල හිඟය | තැපැල් සේවාවන් නොමැතිබව | අඩු ඵලදායිතාවය | ගොවීන් අතර සම්බන්ධයක් නොමැතිකම | වන සතුන්ගෙන් වන හානි | | ප්‍රමුඛතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ඉඩම් අයිතිය නොමැති බව | | 1 | 1 | 1 | 1 | 1 | 1 | 6 | 1 |
| 2. කෘෂි ව්‍යාප්ති සේවාවන් නොලැබීම | | | 3 | 2 | 2 | 6 | 2 | 3 | 3 |
| 3. ජල හිඟය | | | | 3 | 3 | 3 | 3 | 5 | 2 |
| 4. තැපැල් සේවාවන් නොමැතිබව | | | | | 5 | 4 | 4 | 2 | 5 |
| 5. අඩු ඵලදායිතාවය | | | | | | 5 | 5 | 3 | 4 |
| 6. ගොවීන් අතර සම්බන්ධයක් නොමැතිකම | | | | | | | 7 | 1 | 7 |
| 7. වන සතුන්ගෙන් වන හානි | | | | | | | | 1 | 6 |


මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 05 - වර්ෂාපතනය/උෂ්ණත්වය වෙනස්වීම් ඉහළ ගුරුවල ගම්මානය





මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

## රූප සටහන් අංක 06 බෝග වගා කාලසටහන - ඉහළ ගුරුවල





මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 07 - කෘෂිකාර්මික කටයුතුවල ශ්‍රම විභජනය




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI


2.15 . හරස්කඩ වාර්තාව - ගුරුවල ග්‍රාමය



| පස | රතු/දුඹුරු | රතු/දුඹුරු | රතු/දුඹුරු | මැටිපස | මැටිපස | වැලි පස | රතු/දුඹුරු | බොරළු |
|---|---|---|---|---|---|---|---|---|
| ගස්/බෝග | තේක්ක/කොහොඹ | කෙසෙල් ලදු කැලෑ | පොල්, කොස්, දිවුල්, මුරුංගා | කොහොඹ, කජු | තේක්ක/ලදු කැලෑ | කොහොඹ | තේක්ක/කජු | තේක්ක/අඹ/ කජු |
| ජලය | - | - | වැව | නල ළිඳ | වැව | ළිඳ | - | - |
| සත්ව පාලනය | - | - | - | - | - | - | - | - |
| වගා රටා | - | බඩ ඉරිඟු මඤ්ඤොක්කා කෙසෙල් | මඤ්ඤොක්කා/ කෙසෙල් | කෙසෙල්/ පොල් | වී වගාව/පොල් | පොල්/කෙසෙල් | පොල්/කෙසෙල් | පැපොල් |
| හඳුනාගත් ගැටළු | - | - | වැව් රක්ෂිතය වගා කිරීම | - | - | - | - | - |
| යෝජිත විසඳුම් | - | - | - | - | - | - | - | - |
| වෙනත් සම්පත් | විදුලිය | මැටි | ලදු කැලෑ භූමිය | වගා කළ හැකි භූමිය | භූමිය | භූමිය/විදුලිය | භූමිය/විදුලිය | ගබඩාව විදුලිය |


මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 08 ඉහළ ගුරුවල - ගැටළු ගස




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 09 ඉහළ ගුරුවල - ඉලක්ක ගස




මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

2.16.සංවර්ධන සැලසුම - ඉහළ ගුරුවල ගම්මානය

අරමුණ 1 - එළවළු ඇතුලු ගොඩ භෝග වගාවෙන් කුටුම්භයක මාසික ආදායම


රු. 4000/- සිට රු. 6000/- දක්වා වැඩි කිරීම

| ගැටලුව | විසදීම සඳහා ක්‍රියාකාරකම් | කාල රාමුව | වගකීම | පිරිවැය |
|---|---|---|---|---|
| ජලය නොමැතිවීම | වැවේ ජල ධාරිතාවය වැඩිකිරීම<br>වැසි දිය පොකුණු ඇතිකිරීම<br>කෘෂි ළිං ඇති කිරීම<br>වන වගා සංරක්ෂණ ක්‍රම ඇතිකිරීම | 2006/2007 මහ කන්නයට පෙර | ගොවිජන සංවර්ධන නිලධාරි<br>කාර්මික නිලධාරි<br>කෘ.ප. නි. ස. | |
| නීත්‍යානුකූල ඉඩම් අයිතිය නොමැතිවීම | ගොඩ ඉඩම් සඳහා නීත්‍යානුකූල ඔප්පු ලබා දීමට කටයුතු කිරීම | 2006 දෙසැම්බර් | දිස්ත්‍රික් ලේකම්<br>ප්‍රාදේශීය ලේකම්<br>ග්‍රාම නිලධාරි | |
| කෘෂි යෙදවුම් ලබා ගැනීමේ අපහසුව | ගොවි සංවිධානයක් පිහිටුවීම<br>අලෙවිසැලක් ඇති කිරීම<br>කාබනික පොහොර නිපදවීම | 2006/2007 මහ කන්නයට පෙර | ගොවිජන සංවර්ධන නිලධාරි<br>කෘ.ප.නි.ස.<br>කෘෂිකර්ම උපදේශක | |
| කෘෂි තාක්ෂණ දැනුම නොමැතිවීම | පුහුණු පන්ති පැවැත්වීම<br>ආදර්ශන පැවැත්වීම<br>ක්ෂේත්‍ර දින/ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම | 2006/2007 මහ කන්නයට පෙර | කෘෂිකර්ම උපදේශක | |
| කෘෂි අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම | ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රම ඇතිකිරීම<br>සමූහ අලෙවි ක්‍රම ඇති කිරීම<br>අගය එකතු කල නිෂ්පාදන පිළිබඳව දැනුම ලබාදීම | 2006/2007 මහ කන්නයට පෙර | කෘෂිකර්ම උපදේශක<br>කෘ.ප.නි.ස. | |

අරමුණ 2 - මිරිදිය මත්ස්‍ය වගාව හඳුන්වා දීම තුලින් ගොවීන් 10 දෙනෙකුට
රු. 10000/- ක අතිරේක වාර්ෂික ආදායම් මාර්ගයක් ඇති කිරීම

| ගැටලුව | විසඳීම සඳහා ක්‍රියාකාරකම් | කාල රාමුව | වගකීම් | පිරිවැය |
|---|---|---|---|---|
| ආයතන සහාය නොලැබීම<br>ප්‍රමාණවත් ජල ධාරිතාවක් වැවේ නොතිබීම | ජල ධාරිතාව වැඩි කිරීමට පියවර ගැනීම<br>ධීවර සමිතියකින් ඇතිකිරීම<br>දැනුම ලබාදීම | 2006/2007 | ජලජ සම්පත් සංවර්ධන නිලධාරී<br>ගොවිජන සංවර්ධන නිලධාරී<br>කෘ.ප.නි. ස. | |

2.17. ගම්මාන සිතියම - ඉහළ දැරුවල.




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි HARTI

# තුන්වන පරිච්ඡේදය
# වීරගස්වැව ගම්මානය

## 3.1 ගමේ පිහිටීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අගුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 210 වීරගස්වැව ග්‍රාමනිලධාරී වසම තුළ වීරගස්වැව ග්‍රාමය පිහිටා ඇත. අගුණුකොළපැලැස්ස මිද්දෙනිය ප්‍රධාන මාර්ගයේ අගුණකොළපැලැස්ස සිට කි.මී. 10 ක් පමණ ගිය විට හමුවන බුවැලිආර ඇල අසලින් වමට හැරී කි.මී. 1.5 ක් පමණ ගොස් නැවත වමට හැරී කි.මී. 4 ක් පමණ ගිය තැන වීරගස්වැව ගම්මානය හමුවේ.

## 3.2. ඉතිහාසය හා කාල රේඛාව

ගැමියන් සමග කරන ලද සාකච්ඡාවලින් හෙළිවූ පරිදි මෙම ගම්මානය 1969 වසරේ සිට ගොවිජනපදයක් බවට පත්වී ඇත. එම කාල වකවානුවට පෙර පිටස්තර ගම්මානවලින් පැමිණි අය හේන් ගොවිතැන සඳහා මෙම භූමි ප්‍රදේශය භාවිතාකොට ඇත. 1969 වසරේදී මුරුතවෙළ සංවර්ධන ව්‍යාපාරය යටතේ ගොඩ ඉඩම් අක්කර 1/2 ක් හා මඩ ඉඩම් (කුඹුරු ඉඩම්) අක්කර 2 බැගින් බෙදා දෙමින් මෙහි ගොවි පවුල් පදිංචි කරවීමත් සමග මෙය ගොවි ජනපදයක් බවට පත්වී ඇත. (මෙසේ ඉඩම් ලබා දීමේදී කලින් සිට මෙම ප්‍රදේශය තුළ හේන් ගොවිතැන් කරමින් පදිංචිව සිටි පවුල්වලට ද ඉඩම් ලැබී ඇත.)

**කාල රේඛාව**

1969 - හේන් ගොවිතැන සඳහා ගොවීන් මෙම ප්‍රදේශයට පැමිණීම
- මුරුතවෙල ව්‍යාපාරය ආරම්භ කර යාය 1 හා යාය 2 ලෙස බෙදීම
- ගොඩ ඉඩම් අක්කර 1/2 හා මඩ ඉඩම් අක්කර 2 බැගින් පවුල් 50 කට ඉඩම් ලබාදීම
- වල් අලි උවදුර පැවතීම
- සියලුම වැව් ගංවතුරෙන් විනාශවීම

1975 - කුඹුරු ඉඩම් සඳහා ජලය ලබාදීම

1978 - නෝරාඩ් අධාරමත වැසිකිළි ලබාදීම

1986 - සීඩා කුඩා කණ්ඩායම් ඇති කිරීම
- වපිරසාර දහම්පාසල ඇති වීම
- දිලෙනතරු පෙර පාසල ඇතිවීම

1987 - ගොවි සංවිධානය ආරම්භ වීම

1989 - පාසල විවෘත වීම

1993 - පෝරුඩ් ආධාර මත වීරගස්වැව ප්‍රතිසංස්කරණය කිරීම

1995 - සමෘද්ධි වැඩසටහන යටතේ කුඩා කණ්ඩායම් ආරම්භවීම

1998 - ගමේ කොටසකට විදුලිබලය ලබාදීම

2002 - මරණාධාර සමිතිය ආරම්භ වීම

2004 - වීරශක්ති ප්‍රජාමූල සංවිධානය බිහිවීම

2005 - දිනකර යෞවන සමාජය හා දිනසුරු ළමා සමාජය ආරම්භය

### 3.3. ජනගහනය හා අධ්‍යාපනය

වීරගස්වැව ගම්මානයේ මුළු පවුල් සංඛ්‍යාව 135 වන අතර මුළු ජනගහනය පුද්ගලයින් 512 කි. සියල්ලෝම සිංහල බෞද්ධයෝ වෙති.

අධ්‍යාපන තත්ත්වය පිළිබඳව විමසා බැලීමේදී එය ඉතා හොඳ මට්ටමක තිබෙන බව කිව හැක. සියළු දෙනාටම පාහේ කියවීමේ හා ලිවීමේ හැකියාව ඇත. අධ්‍යාපන මට්ටම දැක්වෙන 3.1 වගු සටහනට අනුව 8 ශ්‍රේණිය හා ඊට ඉහළ අධ්‍යාපනයක් ලත් බහුතර පිරිසක් සිටින බව පෙනේ. ගමෙහි මේ වන විට පාසල් සිසුන් 234 පමණ සිටින අතර පාසල් යායුතු වයසේ පසුවන නමුත් පාසල් නොයන ළමයින් 05 දෙනෙකු ද හඳුනාගත හැක.

**3.1 වගුව - අධ්‍යාපන මට්ටම : වීරගස්වැව ගම්මානය**

| අධ්‍යාපන මට්ටම | ස්ත්‍රී සංඛ්‍යාව | පුරුෂ සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| 8 වන ශ්‍රේණියට අඩු අධ්‍යාපනයක් ලැබූ | 58 | 49 | 107 |
| 8 ශ්‍රේණිය සමත් | 32 | 26 | 58 |
| සාමාන්‍ය පෙළ සමත් | 10 | 08 | 18 |
| උසස් පෙළ සමත් | 02 | 02 | 04 |
| උපාධිධාරී | - | 01 | 1 |
| එකතුව | 102 | 86 | 188 |

*මූලාශ්‍රය : ග්‍රාම නිලධාරී වාර්තා - වීරගස්වැව*

මීට අමතරව වෘත්තීය අධ්‍යාපනය ලැබූ පුද්ගලයින් 05 දෙනෙකු හඳුනාගත හැකිය.

### 3.4. රැකියා සහ ආදායම් තත්ත්වය

වීරගස්වැව ගම්වාසීන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තයයි. ඊට අමතරව කෘෂි හා කෘෂි නොවන අංශයන්හි ශ්‍රමිකයින් ලෙස කටයුතු කරන සැලකිය යුතු පිරිසක් සිටී. 3.2 වගු සටහන ගම්වාසීන්ගේ රැකියා නියුක්තියේ ස්වරූපය පිළිබඳව පැහැදිලි විස්තරයක් සපයයි.

3.2 වගුව - රැකියා නියුක්තිය : වීරගස්වැව ගම්මානය

| රැකියාවේ ස්වභාවය | ස්ත්‍රී | පුරුෂ | එකතුව | මුළු සංඛ්‍යාවෙහි ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ගොවිතැන | 36 | 90 | 126 | 62 |
| ශ්‍රමිකයින් | 10 | 30 | 40 | 20 |
| පෞද්ගලික අංශයේ රැකියා | 04 | 08 | 12 | 6 |
| රජයේ රැකියා | 03 | 04 | 07 | 3.5 |
| ස්වයං රැකියා | 02 | 05 | 07 | 3.5 |
| විදේශ රැකියා | 07 | - | 07 | 3.5 |
| ව්‍යාපාර කටයුතු | - | 03 | 03 | 1.5 |
| **එකතුව** | 62 | 140 | 202 | 100 |

*මූලාශ්‍රය : ග්‍රාම නිලධාරී වාර්තා - වීරගස්වැව*

මීට අමතරව රැකියා බලාපොරොත්තුවෙන් සිටින තරුණයින් 25 දෙනෙකු පමණ ගම තුළ සිටී.

ගම් වැසියන්ගේ ආදායම් මට්ටම් පිළිබඳව විමසා බැලීමේදී ඉහළම ආදායම් කණ්ඩායමට අයත් පවුල් 01ක් ද මධ්‍යම ආදායම් ලබන පවුල් 08 ක් හා පහළ ආදායම් ලබන පවුල් 126 ක් හඳුනාගත හැකිවිය. ගමෙහි සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව 101 කි. එය මුලු පවුල් සංඛ්‍යාවෙන් 75% කි.

## 3.5. කෘෂිකාර්මික කටයුතු

වීරගස්වැව ගම්මානය වියළි කලාපයට අයත් ගොවි ගම්මානයක් බැවින් එහි ශ්‍රී ලංකාවේ වියළි කලාපයට ආවේණික වගා රටාවක් දක්නට ලැබේ. එනම්,

1. පහත් බිම්වල වී වගාව
2. හේන් වගාව
3. ස්ථාපිත ගෙවතු වගාව වශයෙනි

පහත් බිම්වල වී වගාව මූලික ලෙසම වාරිජල සම්පාදන ක්‍රම යටතේ සිදු වේ. මේ යටතේ අක්කර 385 ක් පමණ යල මහ දෙකන්නයේ වගා කෙරේ. මෙහිදී මහ කන්නයේදී වී වගාවත් යල කන්නයේදී අතිරේක භෝග වගාවන් සඳහා ජලය සැපයේ. මුරුතවෙල ව්‍යාපාරයේ $D_2$, $D_3$, $D_4$ හා $D_5$ යන ඇළ මාර්ග ඔස්සේ ගම්මානයේ කුඹුරු සඳහා ජල සම්පාදනය සිදුවේ.

සැප්තැම්බර් - ඔක්තෝම්බර් කාල වකවානුවල ඇද හැලෙන වර්ෂාවත් සමග මහ කන්නය සඳහා හේන් වගාව ආරම්භවන අතර ඒ තුළ මිශ්‍ර භෝග වගා රටාවක් දක්නට ලැබේ. කුරක්කන්, රටකජු,, තල, බඩ ඉරිගු, කව්පි, මුං ඇට යනාදිය ප්‍රධාන භෝග වශයෙන් පවතී.

ස්ථාපිත ගෙවතු වගාවන් යටතේ බහු වාර්ෂික භෝග වගාවන් සුළු වශයෙන් දක්නට ලැබේ. ඒ යටතේ අඹ, ගස්ලබු, කෙසෙල්, දෙහි, දොඩම් හා පොල් යන වගාවන් පවතී.

## 3.6. මාර්ග පද්ධතිය හා භෞතික යටිතල පහසුකම්

### 3.6.1 මාර්ග පද්ධතිය :

ගම මැදින් දිවෙන ප්‍රධාන හා අප්‍රධාන ඇල මාර්ගවලට සමගාමීව මාර්ග පද්ධතිය ද සකස් වී ඇත. ගම තුළ පිහිටි කිසිදු මාර්ගයක් ගල් අතුරා තාර දමා සකස් කර නොමැති අතර ඒ හේතුවෙන් මාර්ග පද්ධතිය දුර්වල මට්ටමක පවතී. විශේෂයෙන්ම වැසි කාල වකවානුවලදී ගමනාගමන කටයුතු ඉතා දුෂ්කර මට්ටමක පවතින බව ගම්වාසීන් විසින් දැඩිව අවධාරණය කරන ලදී.

### 3.6.2.. භෞතික යටිතල පහසුකම්

#### 3.6.2.1 ජල සම්පාදන ක්‍රම (කෘෂිකාර්මික කටයුතු සඳහා)

වගා කටයුතු සඳහා ප්‍රධාන ලෙසම ජලය සැපයෙන්නේ මුරුතවෙල ව්‍යාපාරය යටතේය. මීට අමතරව වීරගස්වැව හා වැලිආර යන වැව් දෙක මගින් ද වගා කටයුතු සඳහා ජලය සපයාගනී. ස්ථිර ජල සැපයුම් මාර්ගයක් නොමැති එහෙත් වැස්සෙන් පෝෂණය වන මෙම වැව්වල බොහෝ විට ජලය ප්‍රමාණවත් පරිදි රැස් නොවීම හේතුවෙන් යල කන්නයේ වගාවන්වල සීමාවීමක් දක්නට ලැබේ.

#### 3.6.2.2. ජල සම්පාදන කටයුතු (සාමාන්‍ය භාවිතය)

ගම හරහා වැටී ඇති ඇල මාර්ග තුළින් නෑම සහ රෙදි සේදීම වැනි සාමාන්‍ය අවශ්‍යතා සඳහා ජලය සපයාගන්නා අතර රජය මගින් ඉදිකර ඇති පොදු ළිං මගින් පානීය ජල අවශ්‍යතාවය සපුරාගනී. ඊට අමතරව පෞද්ගලික මට්ටමෙන් ගෙවතු තුළ සකසාගත් ළිංවලින් ද පානීය ජල අවශ්‍යතාවය සපුරාගනී.

#### 3.6.2.3 නිවාස හා වැසිකිළි පහසුකම්

ගමෙහි සමස්ත නිවාස සංඛ්‍යාව වන නිවාස 135 න් නිවාස 115 ක් උළු සෙවිලිකළ නිවාස වේ. ඉතිරි 20 පොල් අතු සෙවිලිකර ඇති ඒවා වන අතර කටුමැටි බිත්ති සහිත නිවාස සංඛ්‍යාව 02 කි.

සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධව ඉතා වැදගත් සාධකයක් වන වැසිකිළි භාවිතය පිළිබඳව සැලකීමේදී මුළු නිවාස සංඛ්‍යාවෙන් 120 ක් ජල මුද්‍රිත වැසිකිළි සකසාගෙන ඇති අතර ඉතිරි 15 සෞඛ්‍ය අතින් අනාරක්ෂිත ආකාරයෙන් යුත් වැසිකිළි සකසාගෙන ඇත.

### 3.6.2.4. කෘෂි උපකරණ, යන්ත්‍රසූත්‍ර හා වාහන

ගම්වාසීන් සතුව පවත්නා කෘෂිකාර්මික උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා වාහන පහත සඳහන් ලෙස සංඛ්‍යාත්මකව දැක්විය හැක.

අත් ට්‍රැක්ටර් 10
යතුරු පැදි 20
ලොරි 01
ත්‍රී රෝද රථ 05
තෙල් ඉසින යන්ත්‍ර 15
කොළ මඩින යන්ත්‍ර 04

## 3.7. ඉඩම් පරිහරණය හා භුක්තියේ ස්වරූපය

ගමෙහි මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 575 ක් පමණ වේ. ඉන් අක්කර 190 ක් ගොඩ ඉඩම් වන අතර අක්කර 385 ක් මඩ ඉඩම් වේ.

ගම් වැසියන් සතු ඉඩම් අයිතිය අනුව වර්ග කිහිපයක් හඳුනාගත හැකිය.

1. ප්‍රවේණි ඉඩම් (සින්නක්කර ඉඩම්)
2. රජයේ ඉඩම් (ජයභූමි හා ස්වර්ණභූමි ඔප්පු සහිත ඉඩම්)

ප්‍රවේණි ඉඩම් අතර අක්කර 60 ක පමණ භූමි ප්‍රමාණයක් එක් පුද්ගලයකු සතුව පවතින අතර එය කිසිදු වගාවකට නොයොදා ලද කැළෑවක් බවට පත්වී තිබේ.

මුරුතවෙල ව්‍යාපාරය යටතේ ඉඩම් ලබාගත් ගොවීන් වෙනුවෙන් ජය භූමි හා ස්වර්ණභූමි යන ක්‍රම යටතේ ඔප්පු ප්‍රදානය කර ඇත. එසේ නමුත් ගමේ ඉඩම් අයිතිය ලැබූ ගොවීන් ඒවා අතහැර මුල් ගම් වෙත යාම හේතුවෙන් සමහර ඉඩම් වල්බිහිවී ඇති අතර එවැනි ගොඩ ඉඩම්වල ගොවීන්ගේ දෙවන පරම්පරාවේ අය අනවසරයෙන් පදිංචි වී ඇත. කෙසේ නමුත් කුඹුරු ඉඩම්වල තත්ත්වය ඊට වඩා වෙනස්වේ. ප්‍රදේශය හැරගිය පුද්ගලයින් යටතේම ඒවායේ අයිතිය පවතින අතර ගමේ දැනට පදිංචිව සිටින්නෝ අඳ ක්‍රමය හා වෙනත් හුවමාරු ක්‍රම යටතේ ඒවායෙහි  වගා කටයුතු සිදු කරති. මෙය ඇලවේලි නඩත්තුවේදී හා පිළිසකර කටයුතු සිදු කිරීමේදී ප්‍රධාන බාධකයක් බවට පත්ව ඇත.

## 3.8 ප්‍රජා සංවිධාන

ගම්වාසීන්ගේ විවිධ අවශ්‍යතාවයන් සඳහා ඔවුන් විසින්ම ගොඩනගා ගත් ප්‍රජා සංවිධාන කිහිපයක් ගම තුළ වෙති. ඔවුන්ගෙන් ලද තොරතුරුවලට අනුව එකී ප්‍රජා සංවිධාන ප්‍රමුඛතාගත කළ ආකාරය පහත දැක්වේ.


1. සමෘද්ධි සමිතිය
2. ගොවි සංවිධාන - ඇල සංවිධාන 04 කි
3. මරණාධාර සමිතිය
4. ග්‍රාම සංවර්ධන සමිතිය
5. ප්‍රජාමූල සංවිධානය
6. දිනකර යෞවන සමාජය
7. දිනසුරු ළමා සමාජය
8. විශාඛා කුලගන සමිතිය
9. දායක සමිතිය
10. ධීවර සමිතිය
11. ප්‍රජා ග්‍රාමීය සංවිධානය (පෝරුඩ්)
12. පාසල් සංවර්ධන සමිතිය
13. විරතරු වැඩිහිටි සමාජය

## 3.9 සේවා සපයන ආයතන මගින් ගමට ඇති බලපෑම

විරගස්වැව ගම්වාසීන්ට සේවා සපයන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන බොහොමයක් ගමෙන් පරිබාහිරව පිහිටා තිබේ. ගම්මුන් සමග කරන ලද සාකච්ඡාවේදී එකී විවිධ ආයතන ගම්වාසීන්ට සම්පව් ඇති ආකාරය අනුව ප්‍රමුඛතාගත කළ අයුරු පහත දැක්වේ.

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. පන්සල
3. තැපැල් කාර්යාලය
4. පොලීසිය
5. ගොවිජන සේවා මධ්‍යස්ථානය
6. බැංකු (රාජ්‍ය හා පෞද්ගලික)
7. ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිය
8. පෝරුඩ් ආයතනය (රාජ්‍ය නොවන සංවිධානයකි)
9. ප්‍රාදේශීය සභාව
10. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
11. ව්‍යාපාර අධිකාරී කාර්යාලය


රූප සටහන් අංක 10
ගම තුළ පිහිටි ප්‍රජා සංවිධාන ඒවායෙහි සාමාජික සංඛ්‍යාව අනුව හා ගමෙන් පිටස්තරව සාමාජිකත්වය බෙදී ඇති ආකාරය




සටහන : වෘත්තයේ ප්‍රමාණයෙන් සාමාජික සංඛ්‍යාවෙහි විශාලත්වය පෙන්නුම් කෙරේ.
මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි **HARTI**

රූප සටහන් අංක 11

**විරගස්වැව ගම්මානයේ පිහිටි ප්‍රජා සංවිධාන මගින් ගමට ඇති බලපෑම දැක්වෙන වෙන්රූප සටහන.**





සටහන : වෘත්තයන්ගේ විශාලත්වයෙහි ප්‍රමාණය අනුව ඒවායින් ගමට සිදුවන බලපෑම පෙන්නුම් කෙරේ.

වෘත්තයන් එකිනෙක ඡේදනය වීමෙන් සංවිධාන කීපයක සාමාජිකත්වය දැරීම පෙන්නුම් කෙරේ.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි **HARTI**


රූප සටහන් අංක 12
සේවා සපයන ආයතන මගින් ගමට ඇති බලපෑම දැක්වෙන වෙන් රූප සටහන




සටහන : වෘත්තයේ ප්‍රමාණයෙන් ගමට ලැබිය යුතු සේවය දැක්වේ.
• දුර අනුව ගමට ඇති සමීපතාවය දැක්වේ.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි **HARTI**

රූප සටහන් අංක 13 - වීරගස්වැව ගම්මානය





ගමේ සහභාගීත්වය : මංජුල කුමාර, පියදාස

පහසුකම් සැපයුවෝ : ජගත් ශාන්ත වර්ණකුල, එස්. සමරවික්‍රම, ආර්.එම්.දිසානායක

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි **HARTI**

## රූප සටහන් අංක 14, හරස්කඩ චාරිකාව : වීරගස්වැව ගම්මානය




| පස් වර්ගය | රතු දුඹුරු පස් | කුඹුරු ඉඩම්වල ගොඩ කොටස | ගෙවතු බොරළු පස් | රතු දුඹුරු | කුඹුරු ඉඩම් |
|---|---|---|---|---|---|
| ගස් | මස් රූම්<br>ඇට්ටික්කා<br>කඳුරු | | පොල්, බෙලි,<br>හල්මිල්ල<br>පැපොල් - දිවුල් | පොල්, ලඳු කැළෑ | |
| ජල මට්ටම | අඩි 10 ක් පමණ | අඩි 10 ක් පමණ | අඩි 30 ට වඩා ගැඹුරුයි | අඩි 40 | අඩි 5 |
| සත්ව පාලනය | නැත | - | සුළු වශයෙන් | - | - |
| කෘෂි භෝග | වී වගාව | මැහි බෝග (කරවිල, පතෝල, වැටකොළු) | පැපොල්, දොඩම්<br>කෙසෙල් දෙහි | මැහි බෝග ,<br>පොල් | වී, කෙසෙල්<br>පොල්, මැහි භෝග |
| ගැටළු | 1.ඉඩම් නිරවුල් නොවීම<br>2.කෘෂි පාරවල් ප්‍රතිසංස්කරණය නොවීම<br>3. ඇල මාර්ග අබලන් වීම | යල කන්නයේ ජල හිඟය | ජල හිඟය | ජල හිඟය<br>විදුලි බලය නොමැතිවීම | 1. ඉඩම් රජයට අයත්වීම<br>2. ජලය ප්‍රමාණවත් නොවීම |
| විසඳුම් | 1. නිෂ්පාදනය වැඩිකිරීම සඳහා වක්‍රීය අරමුදල් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම<br>2. ගොවීන් කුඩා කණ්ඩායම් ලෙස සංවිධානය කිරීම | මධ්‍යම මට්ටමේ කෘෂි ළිං මගින් යල කන්නයේ ගොඩ භෝග වගා කිරීම | | 1. කෘෂි ළිං ඉදිකිරීම<br>2. විදුලිය ලබාදීම | 1. ඉඩම් නිරවුල්කර ජනතාවට ලබාදීම<br>2. වැව ප්‍රතිසංස්කරණය කිරීම<br>3. වැලි ආර වැවේ පිටවාන සකස් කිරීම |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI


රූප සටහන් අංක 15 : භෝග වගා කාල සටහන

වීරගස්වැව





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 16 - උෂ්ණත්වය හා වර්ෂාපතනය : විරගස්වැව ගම්මානය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 17- කාර්යබහුලතාවය : විරගස්වැව ගම්මානය





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006 පෙබරවාරි HARTI

## 3.10 වීරගස්වැව ගම්මානයේ ප්‍රමුඛතාගත ගැටළු

වීරගස්වැව ගමම්මානයේ ගොවීන් සමග කළ සාකච්ඡාවේදී ඔවුන් දැනට මුහුණපාන විවිධාකාර වූ ගැටළු ඉදිරිපත් විය. එකී ගැටළු බලපෑමෙහි ස්වරූපය මත ප්‍රමුඛතාගත කළ ආකාරය පහත දැක්වේ.


1. කෘෂිකාර්මික අංශයෙහි අඩු ඵලදායීතාව
2. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය හිඟකම
3. ඉඩම් හිඟය
4. විදුලි බලය නොමැතිකම
5. කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ප්‍රාග්ධන හිඟය
6. කෘෂි උපදෙස් නොලැබීම
7. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හිඟය
8. කෘෂි නිෂ්පාදන අලෙවි දුෂ්කරතා
9. ප්‍රවාහන දුෂ්කරතා
10. ඉඩම් නිරවුල් නොවීම
11. ඇලමාර්ග පුනරුත්ථාපනය නිසිලෙස සිදු නොවීම
12. පවුල් සෞඛ්‍ය සේවා උපදෙස් නොලැබීම

රූප සටහන් අංක 18 : ගැටලු ගස - වීරගස්වැව ගම්මානය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

රූප සටහන් අංක 19 : අරමුණු ගස - වීරගස්වැව ගම්මානය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 පෙබරවාරි HARTI

3.11 ව්‍යාපෘති සැළැස්ම

අරමුණ : වීරගස්වැව ගම්මානයේ කෘෂිකාර්මික කටයුතුවල නිරත පවුලක මාසික ආදායම වසරක් තුළදී රු. 4000.00 සිට රු. 6000.00 දක්වා ඉහළ නැංවීම

| ගැටළුව | විසඳුම | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන්/ අක්කර | කාලය | වගකීම | පිරිවැය |
|---|---|---|---|---|---|---|
| ගොඩ භෝග සඳහා අලෙවි දුෂ්කරතා පැවතීම | වෙළඳපොළ ඉල්ලුමට ගැළපෙන පරිදි නිෂ්පාදනය කිරීම | 1. වෙළඳපොළෙහි ඉහළ ඉල්ලුමක් සහිත භෝග වගා සැළැස්මක් සැකසීම | ගොවීන් 50 | 2006 යල කන්නය ආරම්භයට පෙර | ◆ කෘෂිකර්ම උපදේශක<br>◆ ගොවි සංවිධානය<br>◆ කෘ.ප.නි.ස. | මේ සඳහා යන පිරිවැය ගොවීන් සමග සාකච්ඡා කර නිවැරදිව ඇතුලත් කළ යුතුයි. |
| | | 2. තත්ත්වයෙන් ඉහළ නිෂ්පාදන වෙළඳපොළට සැපයීමට ගොවීන් දැනුවත් කිරීම | ගොවීන් 50 | 2006 යල කන්නය ආරම්භයට පෙර | ,, | මේ සඳහා යන පිරිවැය ගොවීන් සමග සාකච්ඡා කර නිවැරදිව ඇතුලත් කළ යුතුයි. |
| | | 3. නිෂ්පාදන සඳහා ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රම හඳුන්වාදීම | ගොවීන් 10 | 2006 යල කන්නය ආරම්භයට පෙර | ◆ කෘෂිකර්ම උපදේශක<br>◆ කෘ.ප.නි.ස.<br>◆ ගොවි සංවිධානය<br>◆ ගොවිජන සං.නි. | මේ සඳහා යන පිරිවැය ගොවීන් සමග සාකච්ඡා කර නිවැරදිව ඇතුලත් කළ යුතුයි. |
| වී වගාවේ ඉහළ නිෂ්පාදන වියදම | වී කිලෝ ග්‍රෑම් 1ක නිෂ්පාදන වියදම රු.9 සිට රු. 8 දක්වා අඩු කිරීමට කටයුතු කිරීම | 1. කාබනික පොහොර භාවිතය වැඩි කිරීම | මුරුතවෙල ව්‍යාපාරය යටතේ වී වගා කරන ගොවීන් 56 | 2006 යල කන්නය ආරම්භයට පෙර | ◆ කෘෂිකර්ම උපදේශක<br>◆ කෘ.ප.නි.ස.<br>◆ ගොවි සංවිධානය | මේ සඳහා යන පිරිවැය ගොවීන් සමග සාකච්ඡා කර නිවැරදිව ඇතුලත් කළ යුතුයි. |
| | | 2. සහනදායී ලෙස ලබාදෙන පොහොර ගොවීන්ට ලබාදීම තහවුරු කිරීම | මුරුතවෙල ව්‍යාපාරය යටතේ වී වගා කරන ගොවීන් 56 | 2006 යල කන්නය ආරම්භයට පෙර | ◆ ගොවිජන සංවර්ධන නිලධාරී<br>◆ කෘ.ප.නි.ස.<br>◆ ගොවි සංවිධානය | මේ සඳහා යන පිරිවැය ගොවීන් සමග සාකච්ඡා කර නිවැරදිව ඇතුලත් කළ යුතුයි. |
| | | 3. පුහුණු පන්ති මාර්ගයෙන් කෘෂිකාර්මික දැනුම ලබාදී රසායනික ද්‍රව්‍ය භාවිතය නිවැරදි කිරීම | මුරුතවෙල ව්‍යාපාරය යටතේ වී වගා කරන ගොවීන් 56 | 2006 යල කන්නය ආරම්භයට පෙර | ◆ කෘෂිකර්ම උපදේශක<br>◆ කෘ.ප.නි.ස.<br>◆ ගොවි සංවිධානය | මේ සඳහා යන පිරිවැය ගොවීන් සමග සාකච්ඡා කර නිවැරදිව ඇතුලත් කළ යුතුයි. |
| | | 4. ගොවීන් සංවිධානගත කිරීම තුළින් යෙදවුම් ලබා ගැනීමට වැඩපිළිවෙලක් සැකසීම | මුරුතවෙල ව්‍යාපාරය යටතේ වී වගා කරන ගොවීන් 56 | 2006 යල කන්නය ආරම්භයට පෙර | ◆ ගො.සං.නි.<br>◆ කෘ.ප.නි.ස.<br>◆ ගොවි සංවිධානය | මේ සඳහා යන පිරිවැය ගොවීන් සමග සාකච්ඡා කර නිවැරදිව ඇතුලත් කළ යුතුයි. |

ඇමුණුම අංක 01

## පුහුණු වැඩසටහනෙහි සම්පත් දායකයින්

| නම | තනතුර | ආයතනය |
|---|---|---|
| වී. කේ. නානායක්කාර මහතා | අධ්‍යක්ෂ | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආචාර්ය ඩබ්. ජී. ජයසේන මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආචාර්ය ඩී. ගමගේ මහතා | අධි පර්යේෂක | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා | අධි පර්යේෂක අංශ ප්‍රධාන වාරි ජල කළමනාකරණ හා ගොවිජන සම්බන්ධතා අංශය | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | අධි පර්යේෂක අංශ ප්‍රධාන කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා | සහාය අධි පර්යේෂක අංශ ප්‍රධාන මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආචාර්ය මර්වින් ජෝශප් මයා | නියෝජිත ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විශේෂ වැඩසටහන | ආහාර හා කෘෂිකර්ම සංවිධානය |

| | | |
|---|---|---|
| ඊ.එම්.ජයසේකර මහතා | නියෝජ්‍ය ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විශේෂ වැඩසටහන | ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| කේ. ඊ. කරුණාතිලක මහතා | විධායක සම්බන්ධීකාරක | කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය |
| ඊ.ඊ.කරුණාතිලක මහතා | | වෘත්තීය පුහුණු අධිකාරිය අඟුණකොළපැලැස්ස |
| පී. පියරත්න මයා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| එස්. එම්. ඊ. සමරකෝන් මහතා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| ආර්. එල්. එන්. ජයතිස්ස මහතා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| එන්. පී. ජ්. සමන්ත මහතා | පර්යේෂණ නිලධාරී | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |
| එන්.එස්.බී.ඇපාකන්ද මහතා | පර්යේෂණ නිලධාරී | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය |

ඇමුණුම් අංක 02

## පුහුණු ලාභීන්ගේ නම් හා ලිපිනයන්

| අංකය | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|
| 01 | එල්.බී. නිමලරත්න මයා | නියෝජ්‍ය කෘෂි.අධ්‍යක්ෂ | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හම්බන්තොට, 047-2220196 |
| 02 | පියසිරි අබේසිංහ මයා | සහකාර කෘෂි අධ්‍යක්ෂ | - එම - |
| 03 | ටී.ඊ. බූසෝ මයා | සහකාර කෘෂි අධ්‍යක්ෂ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය හම්බන්තොට - 047 - 2220791 |
| 04 | ආර්.එච්.එන්. ගුණවර්ධන මයා | සහකාර කෘෂි. අධ්‍යක්ෂ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පලාත්) මොණරාගල 055-2276137 |
| 05 | සී. නානායක්කාර මිය | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය හම්බන්තොට |
| 06 | ඩබ්.එල්.හිරාන් පීරිස් මයා | කෘෂිකර්ම නිලධාරී | දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වීරවිල - 047 - 2237021 |
| 07 | ජගත් ශාන්ත වර්ණකුල මයා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හම්බන්තොට |
| 08 | එස්. අමරවික්‍රම මිය | විෂය භාර නිලධාරී | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හම්බන්තොට |
| 09 | එච්.කේ.එල් අතපත්තු මිය | විෂය භාර නිලධාරිනී (වී) | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හම්බන්තොට - 047 - 2220196 |
| 10 | ඒ.ජී. බාලසූරිය මයා | විෂය භාර නිලධාරී | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මොනරාගල - 055 - 2227637 |
| 11 | කේ.ඒ.එස්. ප්‍රියලාල් මයා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හම්බන්තොට - 047 - 2220196 |
| 12 | එම්.එම්.ඒ. සනීර් මයා | විෂය භාර නිලධාරී | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හම්බන්තොට - 047 - 2220196 |
| 13 | කේ.ඩී.බී. ප්‍රියන්ත මයා | විෂය භාර නිලධාරී | සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, අඟුණකොළපැලැස්ස |
| 14 | ආර්.එම්. දිසානායක මයා | ස්ථාන භාර කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, බඳගිරිය |

| | | | |
|---|---|---|---|
| 15 | ජේ.එම්.ඒ.පී.බී. ජයසිංහ මයා | ස්ථාන භාර කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලය, කල්තොට, බලංගොඩ |
| 16 | යූ.පී. සමන්ත මයා | ස්ථාන භාර කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම උපදේශක කාර්යාලය, යෝධ කණ්ඩිය |
| 17 | එම්.ටී.එච්. නිහාල් වසන්ත මයා | ස්ථාන භාර කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, බෙරලිගල |
| 18 | ඩී.කේ.බී. පලුගස්වැව මහතා | කෘෂිකර්ම උපදේශක | කෘෂි උපදේශක කාර්යාලය, වීරවිල |
| 19 | ඩබ්.එම්. විජේසිංහ මහතා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම උපදේශක කාර්යාලය, සියඹලාංඩුව |
| 20 | ජ්.එච්.ඒ.ටී. සමන්කුමාර මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම උපදේශක කාර්යාලය, තෙලුල්ල |
| 21 | ඩී.පී.එස්. බන්දුල මයා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, අම්බලන්තොට |
| 22 | කේ.එම්.ජ්. කෝනාර මයා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය, ඇතිමලේ |
| 23 | ඩී.ජ්. ප්‍රේමසිරි මයා | කෘෂිකර්ම උපදේශක | ගොවිජන කේන්ද්‍රය,ලුනම, අම්බලන්තොට |
| 24 | ඒ.ඩබ්.එස්.බී. බණ්ඩාරනායක | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම උපදේශක කාර්යාලය, ඔක්කම්පිටිය |
| 25 | එච්.එම්. වික්‍රමසිංහ මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම උපදේශක කාර්යාලය, ඔක්කම්පිටිය |

ඇමුණුම් අංක 03

## ක්ෂේත්‍ර අධ්‍යයනය පැවැත්වූ ගම්මාන අනුව සහභාගි වූවන්ගේ නාම ලේඛනය

| ඉහළ ගුරුවල ගම්මානය | | වීරගස්වැව ගම්මානය | |
|---|---|---|---|
| 01 | බී.එල්. නිමලරත්න මයා | 01 | පියසිරි අබේසිංහ මයා |
| 02 | සී නානායක්කාර මිය | 02 | ටී.ඒ. බුසෝ මයා |
| 03 | ඩබ්. එල්. හිරාන් පීරිස් මයා | 03 | ආර්.එච්.එන්.ගුණවර්ධන මයා |
| 04 | එච්.කේ.එල්.අතපත්තු මිය | 04 | ඒ.ජ. බාලසූරිය මයා |
| 05 | ජගත් ශාන්ත වර්ණකුල මයා | 05 | කේ.ඒ.එස්. ප්‍රියලාල් මයා |
| 06 | එස්. අමරවික්‍රම මිය | 06 | එම්.එෆ්.ඒ . සනීර් මයා |
| 07 | ඩබ්.සී. .බණ්ඩාරවත්ත මිය | 07 | කේ.ඩී.බී. ප්‍රියන්ත මයා |
| 08 | එම්.ටී.එච්. නිහාල් වසන්ත මයා | 08 | ආර්.එම්. දිසානායක මයා |
| 09 | ඩබ්. එම්. විජේසිංහ මයා | 09 | ජේ.එම්.ඒ.පී.බී. ජයසිංහ මයා |
| 10 | ඒ.ඩබ්.එස්.බී. බණ්ඩාරනායක මයා | 10 | ඩී.කේ.බී. පලුගස්වැව මහතා |
| 11 | කේ.එම්.ජ. කෝනාර මයා | 11 | ජ.කේ.ඒ.ටී. සමන්කුමාර මයා |
| 12 | ඩී.ජ. ප්‍රේමසිරි මයා | 12 | ඩී.පී.එස්. බන්දුල මයා |
| 13 | යූ . පී. සමන්ත මයා | 13 | එච්. එම්. වික්‍රමසිංහ මයා |

### සම්පත් දායකයින්

| | | | |
|---|---|---|---|
| 01 | ආචාර්ය ඩබ්.එම්.ජ.බී. ගිරාගම මයා | 01 | ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මයා |
| 02 | ආර්.එම්.ආර්.බණ්ඩාර මයා | 02 | ආචාර්ය මර්වින් ජෝශප් මයා |
| 03 | ඒ. එම්. ජයසේකර මයා | 03 | පී. පියරත්න මයා |
| 04 | එස්.එම්.ඒ. සමරකෝන් මයා | 04 | ආර්.එල්.එන්.ජයතිස්ස මයා |
| 05 | එන්.එස්.බී. ඇපාකන්ද මයා | 05 | එන්.පී.ජ. සමන්ත මයා |